# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2065/28 - 2018 අප්‍රේල් මස 04 වැනි බදාදා - 2018.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* :**ඩීඅයිවීකේබී/එල්එන්ඩී/එල්ඒ/ඩීඒඩීයූආර්/10/1299.**
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* :4/3/9/2012/අයිආර්/28.

දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියේ වම් ඇළෙහි අංක 04 අතු ඇළ ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1299 හල්මිල්ලකොටුව ග්‍රාම නිලධාරී වසමේ පහල හල්මිල්ලකොටුව ගමේ, කුරුණෑගල මැනුම් අධිකාරී විසින් පිළියෙල කර ඇති අවසන් ගම් පිඹුරු අංක 1673 හි අතිරේක අංක 4, පත්‍ර අංක 5හි පහත විස්තර සඳහන් ඉඩම්.

**1. කැබලි අංක 226**

ඉඩමේ නම: කිතුල්ගහමුලහේන සහ ගල්ගොඩහේන; විස්තරය: වත්ත, අවු. 35-40 වයසැති පොල් ගස් 115ක් සහ අවු. 5-10 වයසැති පොල් ගස් 25ක් ඇත; හිමිකම් කියන්නා: රජය (මුල් හිමිකම්පාන්නේ පී. එච්. එම් ද සිල්වා, අංක 16/A, දොන් කරෝලිස් පාර, ජාවත්ත, කොළඹ 05); ප්‍රමාණය: හෙක්: 0.6344.

මායිම් විස්තර

*උතුරට*: අ. ග. පි. 1736 (වල්පාලුව) හි ගම් මායිම සහ 10 I වැනි බිම් කැබැල්ල; *නැගෙනහිරට*: 10I, 10K සහ 227 වැනි බිම් කැබලි; *දකුණට*: 10K, 10J සහ 10I වැනි බිම් කැබලි; *බස්නාහිරට*: 10I වැනි බිම් කැබල්ල සහ අ. ග. පි. 1736 (වල්පාලුව) හි ගම් මායිම.

**2. කැබලි අංක 227**

ඉඩමේ නම: කිතුල්ගහමුලහේන සහ මීතිපිටියෙහේන; විස්තරය: වත්ත, අවු. 35-40 වයසැති පොල් ගස් 10ක්, දිවුල් ගසක්, තේක්ක ගසක්, හැලඹ ගසක්, අවු. 15-20 වයසැති පොල් ගස් 2ක් සහ වතුර වලක් ඇත.; හිමිකම්කියන්නා: රජය (මුල් හිමිකම්පාන්නේ එච්. එම්. බංඩාරතිලක, දොරබාවිල, තුත්තිරිපිටිගම, කොබෙයිගනේ); ප්‍රමාණය: හෙක්: 0.2641.

මායිම් විස්තර

උතුරට: 10I, 10K, 10M සහ 10L වැනි බිම් කැබලි; නැගෙනහිරට: 10L සහ 230 වැනි බිම් කැබලි; දකුණට: 228, 10M, 10L සහ 10K බිම් කැබලි; බස්නාහිරට: 10K, 10J සහ 226 වැනි බිම් කැබලි.

**3. කැබලි අංක 228**

ඉඩමේ නම: මිනීපිටියෙහේන; විස්තරය: ලඳු කැලය සහ වැව; හිමිකම්කියන්නා: රජය (මුල් හිමිකම්පාන්නා නොදනී); ප්‍රමාණය: හෙක්: 0.0168.

මායිම් විස්තර

*උතුරට*: 227 වැනි බිම් කැබැල්ල; *නැගෙනහිරට*: 230, 229 වැනි බිම් කැබලි; *දකුණට*: 230, 229, 90 සහ 10M වැනි බිම් කැබලි; *බස්නාහිරට*: 10M සහ 10L වැනි බිම් කැබලි.

**4. කැබලි අංක 229**

ඉඩමේ නම: වදුරුස්සේවැව, හැලඹවැව; විස්තරය: විවෘත මුඩුබිම සහ වැව; හිමිකම්කියන්නා: රජය; ප්‍රමාණය: හෙක්: 0.0025.

මායිම් විස්තර

*උතුරට*: 228 වැනි බිම් කැබැල්ල; *නැගෙනහිරට*: 230 වැනි බිම් කැබැල්ල; *දකුණට*: 230 වැනි බිම් කැබැල්ල; *බස්නාහිරට*: 230, 90 සහ 228 වැනි බිම් කැබලි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 ජුනි 20 වැනි දින පෙ.ව. 10.00 ට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 ජුනි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර,
ප්‍රාදේශීය ලේකම්
කොබෙයිගනේ.

2018 මාර්තු මස 28 වන දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

04 -660

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* :6/3/7/15/9/5.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :LD/05/2007/MV/156D.

මොරගහකන්ද/ කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් වල විස්තර* :

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගඟල උඩසිය පත්තුවේ ගල්පෝරුගොල්ල ග්‍රාම නිලධාරී වසමේ (E 401 A) පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2017.06.25 දින සම්මත කරන ලද, හුලක්ෂණාත්මක මූලික පිඹුරු අංකය 20, අතිරේක අංකය 133, පත්‍රය 231 දරණ සැළසුමේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කොටස.

**1. කැබලි අංක 8584**

ඉඩමේ නම: කහටගහමුලයාය; විස්තරය: ලඳු කැලය; හිමිකම්කියන්නා: බෙල්ලන්කඩවල, පලුගස්වැව ලිපිනයේ පදිංචි හේනයලෑ ගෙදර ඩේවිට් මයා; ප්‍රමාණය: හෙක්: 0.1133.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 මැයි මස 03 වැනි දින පෙ.ව. 9.00 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 අප්‍රේල් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්
නාඋල.

2018 මාර්තු මස 21 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

04 -661

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* :කු.3/6/2016/8.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :4-3/7/2016/HW/111.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ අංක 2008/89 හා 2017.03.03 දිනැති *විශේෂ ගැසට් පත්‍රයෙහි* මා විසින් පල කර ඇති 07 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි අත්කර ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් විස්තරය යටතේ මූලික පිඹුරු අංක කු 1497 හි (අංක 7A පිටුවෙහි) අනු අංක 136 හා එම අනු අංකය යටතේ සඳහන් විය යුතු කැබලි අංක 509 දරණ ඉඩම් කැබැල්ල සඳහන් වී නොමැති නිසා එම *ගැසට් නිවේදනය* පහත දක්වා ඇති පරිදි සංශෝධනය කරනු ලබන බවත්, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පල කරන ලද දැන්වීම් සංශෝධනය කරනු නොලබන බව ද මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

**136. කැබලි අංක 509**

ඉඩමේ නම: වාගොල්ල හේන හා වාගොල්ල වත්ත; ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: ඩබ්ලිව්. එස්. එස්. රාජපක්ෂ; ප්‍රමාණය: හෙක්: 0.0409.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
පොල්ගහවෙල.

2017 නොවැම්බර් මස 16 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

04 -662

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

ශුද්ධි පත්‍රය

*මගේ යොමු අංකය* :HAK/LAN/1/12.

1964 අංක 28 දරණ අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ 2017 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 2042/29 හා 2018 ජනවාරි 10 වැනි දින අංක 2053/28 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයන්හි III වන කොටසේ පළ කරන ලද මගේ යොමු අංක HAK/LAN/1/12 සහ 2017 ඔක්තෝබර් 23 වැනි දින දරන දැන්වීමේ සඳහන් පරීක්ෂණ දිනය සහ වේලාව ද, වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු දිනය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

9 වන වගන්තිය හිමිකම් පරීක්ෂණ දිනය හා වේලාව - *2018. 04. 25 දින පෙ. ව. 10.00.*

වන්දි ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු දිනය - *2018. 04. 18 දින පෙ. ව. 10.00.*

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
හක්මණ.

2018 මාර්තු මස 28 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

04 -663

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.